Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ගලේවෙල ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක | 01 | PL-1-2016 A රු. 24250-10x250 - 10 x 270 - 10x300 - 12 x 330 -36410/- | (අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් 06 ක් සමත් වීම. |

02. *පොදු සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය;

(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය;

(iii) තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදළ නොවේ.);

(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කළ සහතිකයකින් සනාථ විය යුතුය;

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය;

(vi) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නියමිත පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය;
(ii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ;
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද පළාත් පාලන ආයතනවලට අදළ ආඥා පනත් /පනත්වල විධි විධානවලට ද, ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ සංශෝධන කිරීමේ සම්පූර්ණ බලතල ගලේවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනය අවසානයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අයදුම්පත 2017 ඔක්තෝබර් 06 වැනි දිනට හෝ ඊට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, ගලේවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය ;
02. අධ්‍යාපන සහතිකය ;
03. හැඳුනුම්පතේ පිටපතක් ;
04. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (ඉන් එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරි සහතිකය විය යුතුය) ;
05. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතික.

පී.ඒ.ඩී.ඩබ්. මෙන්ඩිස්,
ගලේවෙල ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 04 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති*
*.................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————————.
(ii) මුලකුරු සමඟ නම :——————————————.
02. ස්ථිර ලිපිනය :——————————————
03. ග්‍රාම නිලධාරි වසම හා අංකය :——————————————
04. උපන් දිනය ඃ අවුරුද්ද:—————— මාසය:—————— දිනය:——————
05. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයසඃ අවුරුදු:—————— මාස:—————— දින:——————
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————
07. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————
08. ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර :——————————————
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :——————————————
10. අධ්‍යාපන සුදුසුකම් :——————————————
11. වෙනත් සුදුසුකම් :——————————————
12. වෘත්තීය සුදුසුකම් :——————————————
13. සේවා පළපුරුද්ද :——————————————

(i) දැනට සේවය කරන ආයතනය :——————————————
(ii) දැනට දරන තනතුර :——————————————
(iii) එම තනතුරට පත් වූ දිනය :——————————————
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

——————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ..............................................මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ........... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි /නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

________________

දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ හෝ
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :________________

පදවි නාමය :________________

දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව තබන්න) :________________

දිනය :________________